# අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
## கல்வித்துறை கல்விசாரா ஊழியர் சங்கம்
## EDUCATIONAL NON - ACADEMIC EMPLOYEE'S UNION

අලවතුගොඩ, මහනුවර. அலவதுகொட, கண்டி. ALAWATHUGODA, KANDY.

ඊ මේල් மின் அஞ்சல் Email : enaeu6727@gmail.com web : www.enaeunion.com

| | | | | | |
|---|---|---|---|---|---|
| ලියාපදිංචි අංකය<br>பதிவிலக்கம்<br>Registration No | 6727 | දුරකථන<br>தொலைபேசி<br>Telephone | 066 - 2056978<br>066 - 2239076 | ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 066 - 2239076 |
| මගේ යොමුව<br>எமது விபரம்<br>My Ref. | අසේ/මා/හි/කො/ස/01 | ඔබේ යොමුව<br>உமது விபரம்<br>Your Ref. | | දිනය<br>திகதி<br>Date | 2013-03-12 |


ගරු සභාපති,

ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව,

කොළඹ.

<u>සියළු පළාත් සභා අධ්‍යාපන සේවකයින්ගේ තනතුරු හා උසස්වීම් අහෝසි කොට ලබා දීමට නියමිත "පාසල් කාර්ය සහයක" තනතුර අහෝසි කර තීන්දුවක් ලබා ගැනීම.</u>

01. කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව ගෙන ඇති තීරණයක් මත සියළුම පළාත් සභා වල කණිෂ්ඨ සේවක තනතුරු 6/2006 රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ වර්ග කර ඇති ශිල්පීය නොවන අර්ධ ශිල්පීය තනතුරු වන සනීපාරක්ෂක කම්කරු, පාසල් කම්කරු, සාමාන්‍ය කම්කරු, කාර්යාල කම්කරු, කාර්යාල සහයක, උද්‍යාන කම්කරු, විද්‍යාගාර සේවක/ සහයක, පුස්තකාල සේවක/ සහයක, අරක්කැමි යනාදී තනතුරු රාශියක් අහෝසි කොට එක් තනතුරක් වන "පාසල් කාර්ය සහයක" නමින් තනතුරක් ස්ථාපිත කර දැනට සේවයේ නියුතු සේවකයින්ට හා ඉදිරි බඳවා ගැනීම් වලදිද එලෙස ක්‍රියාත්මක කරන ලෙස දන්වා ඇත.

02. එහෙත් මෙම තනතුරු අහෝසි කිරීම තුලින් පාසල්, කලාප කාර්යාල ආදී පළාත් සභා ආයතන වල සේවකයින් අතර ගැටුම් නිර්මාණය වීමට මෙන්ම විදුහල්පතිවරුන් පාලනයකින් තොරව කටයුතු කිරීම සිදුවීම නිසා අධ්‍යාපනයට අනර්ථකාරී ක්‍රියාවන් ඇති වීම කඩිනමින් වළක්වාලීම සිදුකළ යුතු බැවින් තනතුරු අහෝසි වීමෙන් සේවකයින්ට අහිමි වූ මූලික අයිතීන් පහත දක්වමු.

01. එක් එක් රාජකාරීමය වශයෙන් බෙදා තිබූ තනතුරු අහෝසි වීමෙන් සෑම රාජකාරියක්ම ඉටු කිරීමට සිදුවීම හා නිශ්චිත රාජකාරියක් නොමැති වීම.

02. එක් එක් තනතුරු සඳහා බඳවා ගත් අධ්‍යාපනික හා වෘත්තීය සුදුසුකම් මෙමගින් අහෝසි වී තිබීම.

03. පුස්තකාල සේවක/ සහයක යන තනතුරු ධාරීන් පුස්තකාල විඥාපන පාඨමාලා හදාරා ඇති සේවකයින්ට පුස්තකාලාධිපති තනතුරට ඉල්ලුම් කිරීමේ හැකියාව අහිමි වීම.

04. "පාසල් කාර්ය සහයක" පත්වීම ලබා දීමට පෙර බඳවා ගත් එක් එක් තනතුරු සඳහා වැටුප් තල අතර වෙනස්කම පවතින බවත් එක් තනතුරක් ඇති කිරීම තුලින් වැටුප් විෂමතාවය පැන නැගීම.

05. අභ්‍යන්තර උසස්වීම් ක්‍රමයක් සඳහා යෑමට අවශ්‍ය තනතුරු අහෝසි වී තිබීම.

06. නිශ්චිත රාජකාරියක් නොමැති වීමෙන් පාසල් පරිපාලනය අවුල් තත්වයට පත්වීම.

07. ඉදිරියේ දී බඳවා ගන්නා අයදුම්කරුවන්ටද මෙමගින් බලවත් අසාධාරණයක් සිදුවීම.

08. පාසල්වල රාජකාරි පැවරීමේදී ගැටළුකාරි තත්වයට පත් වීම.

ඉදිරිපත් කරන යෝජනා :-

අතීතයේ පැවති පාසල් පද්ධතිය දැනට සිසුන්ගෙන් හා තාක්ෂණයෙන්/ විද්‍යාගාර/ පරිඝණක/ නවීන පුස්තකාල/ ශ්‍රව්‍ය දෘශය ඒකක ආදියෙන් දියුණු යුගයක තනතුරු ඇති කර පාසල් සිසුන්ගේ අධ්‍යාපනයට රුකුල් දිය යුතු වනාවා ඇත. එම නිසා දැනට ඇති තනතුරු එලෙසම රැකගෙන පහත ආකාරයට තනතුරු නාමය වර්තමාන ආකාරයට ගැළපෙන අන්දමට යෝජනා කරමු. එහෙත් රාජකාරීමය කිසිදු වෙනසක් සිදු නොකළ යුතු බවත් යෝජනා කරමු.

| දැනට පවතින තනතුර | යෝජනා කරන තනතුර. |
|---|---|
| i. සනීපාරක්ෂක කම්කරු | පාසල් සේවා සහයක |
| ii.පාසල් කම්කරු | පාසල් කාර්ය සහයක |
| iii. මුරකරු | ආරක්ෂක නියාමක |
| iv.පුස්තකාල සේවක | පුස්තකාල කාර්ය සහයක |
| v.පුස්තකාල සහයක | පුස්තකාල කළමණාකරණ සහයක |
| vi.රසායනාගාර සේවක | රසායනාගාර කාර්ය සහයක |
| vii.රසයනාගාර සහයක | රසායනාගාර කළමණාකරණ සහයක |
| viii.කාර්යාල කාර්ය සහයක | කාර්යාල කළමණාකරණ සහයක |
| ix.වතු කම්කරු | වතු සේවා සහයක |
| x.උද්‍යාන කම්කරු | උද්‍යාන සේවා සහයක |
| xi.අරක්කැමි | පිසීම් කළමණාකරණ සහයක |
| xii.ලේඛණාගාර සහයක | ලේඛණාගාර කළමණාකරණ සහයක |
| xiii.ලේඛණ භාරකරු | ලේඛණ කාර්ය කළමණාකරණ සහයක |
| xiv.දුරකථන ක්‍රියාකරු | දුරකථන කාර්ය කළමණාකරණ සහයක |
| xv. ඡායා යන්ත්‍ර පිටපත්කරු | ඡායා පිටපත් කාර්ය කළමණාකරණ සහයක |

අන්සතු කිරීම සපුරා තහනම්

පාසල් පද්ධතියේ දියුණුවත් සමග නඩත්තුවට සේවකයින් නොමැති වීමෙන් පරිඝණක/ පොත්පත්/ විද්‍යාගාර ආදිය කෙටි කලකින් විනාශ වී යෑම හා පාසල් වල අතිකුත් සම්පත් විනාශ වී යෑම ජාතික අපරාධයකි. ඒවා රැක ගැනීම සඳහා පහත තනතුරු ඇති කරන ලෙසද යෝජනා කරමු.

01. පරිගණක කාර්ය කළමණාකරණ සහයක

02. විදුලි කාර්මික ශිල්පී.

03. ජල කාර්මික ශිල්පී.

04. වඩු/ පෙදරේරු කාර්මික ශිල්පී.

උක්ත යෝජනා ඉටු කර ගැනීමටත් දැනට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව ගෙන ඇති තීරණය නිසා දිවයිනේම පාසල් වල හා කලාප කාර්යාල වල සේවයේ නියුතු සේවකයින් 10,000 කට අධික සංඛ්‍යාවකට මුහුණ දීමට සිදුව ඇති හා අනාගතයේදී බඳවා ගැනීම් සිදුවන තනතුරු සඳහා සිදුවන වෘත්තිමය අයිතිවාසිකම් අහිමි කර වීම සම්බන්ධව

පැමිණිලිකරු වශයෙන් :- අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය, අලවතුගොඩ, මහනුවර ස්ථාපිත කොට ඇති එහි ප්‍රධාන ලේකම් අජිත් කේ. තිලකරත්න වන මා විසින් මෙම පැමිණිල්ල ගොනු කරනු ලැබේ.

වගඋත්තර කරුවන් වශයෙන් :- මුදල් අමාත්‍යාංශයේ ලේකම් - පී.බී. ජයසුන්දර මයා, කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක ජනරාල්, සියළුම පළාත් සභා අධ්‍යාපන ලේකම්වරු, (දකුණ, වයඹ, මධ්‍යම, ඌව, නැගෙනහිර, බස්නාහිර, සබරගමුව, උතුරු මැද) , සියළුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂකවරු.

මෙම පැමිණිල්ල කඩිනමින් විභාග කර සමස්ථ අධ්‍යාපන පද්ධතියේ සිටින සේවකයින්ට සිදුවන අගතිය මෙන්ම වෘත්තීමය අයිතිවාසිකම් අහිමි වීම සම්බන්ධව සාධාරණ විනිශ්චයක් ලබා දී දැනට කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කොට ඇති එම උපදෙස් අහෝසි කර තීන්දුවක් ලබා දෙන ලෙසත් දැනට පවතින තනතුරු එලෙස තිබියදී තනතුරු නාමයන් වෙනස් කර යෝජනා කර ඇති නාමයන් කිහිපය ඇති කරන ලෙසට නිර්දේශයක් ලබා දෙන ලෙසට ඉතා කාරුණිකව ඉල්ලමු.

අන්සතු කිරීම් සපුරා තහනම්

ස්තුතියි.

අජිත් කේ. තිලකරත්න
ප්‍රධාන ලේකම්
අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය
අලවතුගොඩ, මහනුවර.
ලි.ප. අංකය 6727

මෙයට විශ්වාසී,

අජිත් කේ තිලකරත්න,

ප්‍රධාන ලේකම්,

අධ්‍යාපන අනධ්‍යයන සේවක සංගමය.